# සරු ගෙවතු සියයක් පිහිටුවන්නට

(කොළඹ, ඇල්ස්ටන් පෙදෙසේ පිහිටුවා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගෙවතු වගා අංශය පිළිබඳ තොරතුරු සමහරක්)

ඒ කාලේ රටට ඕනෑ කරන අත්‍යවශ්‍ය ආහාර හැම එකක් ම වාගේ පිටරටින් ගෙනාවේ. නමුත් හැමදමත් ආහාර පිණිස පිටරට දිහා බලා ඉන්න සිදු වීම අපේ ආත්ම ගරුත්වයට ඔබින්නේ නැහැ. රට අහරින් ස්වයංපෝෂිත කිරීම උදෙසා ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට මුළු රටම වෙහෙසුනා. කොළඹ ඇල්ස්ටන් පෙදෙසේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගෙවතු වගා අංශයේ ආරම්භය සිදු වූයෙන් එබඳු කාලයක යි. 1971 මාර්තු වන විට පිටරටින් මිරිස්, ළූණු, ගෙන ඒම තහනම් කරලයි තිබුනේ. රටේ මේ ද්‍රව්‍යවල විශාල හිඟයක් තිබුණා. උතුරු මැද පළාතෙත්, යාපනයෙත් විශාල ලෙස මිරිස් වැවීම ආරම්භ කළ මුත් කොළඹ හා අනිකුත් නාගරික පෙදෙස්වල මිරිස් හිඟය පිරිමහන්න වෙළඳ පොළට අමුමිරිස් විශාල වශයෙන් කැඩෙන්නට පටන් ගත්තා. අවුරුද්ද පුරා බෙදා හරින්න මිරිස් වෙලීමක් කෙරුනේ නැහැ. මෙහි අවදනම් තත්වය ගැන රජයේ සැලකිල්ල යොමු වුනා. කොළඹ ගෘහණියන්ට අවශ්‍ය අමුමිරිස් සැපයීමට මඟක් සොයා ගත හොත් වෙළඳ පොලට එවන අමු මිරිස් ප්‍රමාණය අඩු කර ගැනීමට හැකි බව ඔවුන් කල්පනා කළා. මෙය ගෙවතු වගා ඇරඹීමට හේතු වුනා. ගෙවල් අසල කුඩා බිම් ප්‍රමාණවල විතරක් නොවෙයි, කට්ටු නිවාසවල පෝච්චිවලත්, ඒවගේ ම පාසැල්වල, රජයේ කාර්යාලවල මේ ව්‍යාපාරය ආරම්භයේ දී ම පුළුල් කර ගෙන ගියා. සෑම ගෙවතු වගා කරුවකුට ම මිරිස් පැල, පොහොර, කෘෂි රසායන අඩංගු අත්මළු යනාදිය ඒ කාලයේ ලබා දී තිබෙනවා.

ගෙවතු වගා අංශයේ ඉතා වැදගත් අවස්ථාවක් වූයේ 1973 දී රත්මලානේ අක්කර 3 1/2 ක භූමියක නේවාසික පහසුකම් හා දේශන ශාලා සහිත පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටු වීම යි. සති 1-2 දක්වා පැවැත්වෙන පුහුණු කිරීමේ පන්ති වල දී පහත සඳහන් විෂයයන් ද උගැන් වේ.

— පැලෑටියකට අවශ්‍ය පෝෂ්‍ය පදර්ත.
— තවාන් සකස් කිරීම, පෝච්චිවල හා ක්ෂේත්‍රයේ පැල සිටුවීම, කෙසෙල් පට්ටා පෝච්චි සකස් කිරීම.
— කොම්පෝස්ට් පෝර සකස් කිරීම.
— එළවළු ගොවිතැන.
— ගොවිපල පාලනය.

මෙම පුහුණු කිරීමේ පන්තිවලට අමතරව ආදර්ශ ගෙවතු, පුහුණු වන්නේ ගේ ප්‍රයෝජනය තකා මෙහි පවත්වා ගෙන එනවා.

දැනට මෙම මධ්‍යස්ථානයෙහි ගෘහණියන්ට පමණක් නොව, පාසැල් දරුවන්ටත්, කාර්යාලවල නිලධාරීන්ටත්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුවල තෝරා ගත් කම්කරුවන්ටත් විශේෂයෙන් මෙම පුහුණු කිරීමේ පන්ති සංවිධානය කරලා තිබෙනවා· පසුගිය ද මෙම ස්ථානයේ කොම්පෝස්ට් පෝර සෑදීම පිළිබඳ පුහුණුව ලැබූ දීර්ඝ කාලීනව බණ්ඩාගාර ගතව සිටින සිර කරුවන් 10 දෙනෙකු වූ අතර, ඉන් දෙදෙනක් දැන් එම අංශයේ ම කම්කරුවන් හැටියට ඉතා දක්ෂ අන්දමින් කටයුතු කරන බවත්, අපට දැනගන්නට ලැබුණා.

ගෙවතු වගා අංශය ආරම්භ කළ දිනවල සිට මේ දක්වාම පවතින ප්‍රධාන අඩුපාඩුවක් වූයේ කොළඹ නගරයේ ගෙවතුවලට උවමනා පැල සැපයීමට තවාන් දැමීමට ස්ථිර භූමි භාගයක් නොමැති කමයි. මුලදී ඔවුන් රීඩ් මාවතේ විශ්ව විද්‍යාල භූමියේ තාවකාලික තවානක් පිහිටුවා තිබුණා. එහි දී ටොරින්ටන් චතුරශ්‍රයේ උද්භිද උද්‍යාන භූමියෙන් ලබා ගත් ඉඩම් කැබැල්ලකට මේ තවාන ගෙන ගියා: එය පසුව බෞද්ධාලෝක මාවතට

(29 වන පිටුව බලන්න)

# සරු ගෙවතු සියයක්...

(14 පිටුව හා සම්බන්ධයි)

ගෙන ගිය නමුත්, 1978 ජනවාරි යේසිට නැවත ටොරින්ටන් චතුරශ්‍රයටම ගෙන යාමට කටයුතු කර ගෙන යයි. ඒ කෙසේ වුනත් 1977 වර්ෂය තුළ රත්මලාන හා බෞද්ධා ලෝක මාවතේ පැල විකිණීමේ මධ්‍යස්ථාන වල දී රු. 65,000 ක් වටිනා පැල ගෙවතු වලට විකුණා තිබෙනවා. මෙයින් වැඩි මනත් ම ජනප්‍රිය එළවළු පැල වර්ග වී තිබෙන්නේ මිරිස් හා බටු පැලත්, ඇට වර්ග අතුරින් බණ්ඩක්කාත් ය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කොළඹ ගෙවතු වගා අංශයට දැනට මීගමුවේ සිට පානදුර දක්වා වූ විශාල ප්‍රදේශයක් අයත් වන අතර, මෙහි ගෙවතු වගා ව්‍යාපාරයට සම්බන්ධව කෘෂිකර්ම උපදේශවරු 11 දෙනෙකුත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවකයින් 13 දෙනෙකුත් කටයුතු කරනවා. කෘෂිකර්ම නිලධාරී, වී. සත්‍යානාතන් මහතා සඳහන් කළ අන්දමට 1978 වර්ෂයේ දී මේ ප්‍රදේශ සෑම පාසලක ම ආදර්ශ ගොවිපලක් පිහිටු කිරීමට ඔවුන් බලාපොරොත්තු වන අතර, ප්‍රධාන වශයෙන් කොළඹ ගෘහණියන් සහභාගි කරවා ගෙන ගෙවතු 100 ක් වගා කිරීමටත් එයින් 10 ක් තෝරා ආදර්ශ ගෙවතු හැටියට පවත්වා ගෙන යාමටත් අදහස් කර තිබෙනවා.